කන කොක් සුද දුටු ලේඛිකාවක්

''ගිය ලූලා මහ එකා'' කියන කියමන සිංහල පිරුළක් පමණක් නොවේ. සිංහල සංස්කෘතික තේමා ගීතයක් බවටද පත්ව ඇත. අපේ අතීත සෞභාග්‍යය, අතීතයේ අපගේ මාතෘ භූමිය දශ රාජ ධර්මයන් පාලනය කළ බෞද්ධ රජවරුන්ගේ බල පරාක්‍රමය හා වීර චිත්‍රම ගැන කතා කිරීමට අපි ආශා කරන්නෙමු. මෙම අතීත ස්වාදය නිසාම බොහෝවිට අපි වර්තමානය දෙස බලන්නට වර්තමානය විමසන්නට පසුබට වන්නෙමු.

මේ රටේ දී මෙම ලක්ෂණය වඩා ඉස්මතු වන්නේද යන්න කිව නොහැකිය. මෙහිදී පවා එම අතීතයේ නිමග්නවීම නිසා අප වටා පවත්නා ජීවිතය හා එහි දක්නට ඇති විශේෂතා නොතකා හැරීමේ පුරුද්දක් අපට ඇතැයි සිතමි. ඕස්ට්‍රේලියානු සමාජයේ මෙරට සංස්කෘතියේ පවත්නා හිතකර ලක්ෂණ අපට නොපෙනෙන්නේ ඒ නිසාය.

මෙහි සිට සිංහලෙන් ලියන අපේ ලේඛකයන් ද එම ආකල්පය දක්වනවා ද යන සැකයක් මට ඉඳහිට ඇති වෙයි.

එහි වරදක් නැතැයි එක් අතකින් කිව හැකිය. අනෙක් අතට, අප මෙහි සිට ලියන දේ මේ රටින් බැහැර සිටිනුන්ද කියවන හෙයින් - කියවිය යුතු හෙයින් එයින් අපටම පාඩුවක් විය හැකිය. අප ලියන දෙයක අගයක් අතොත් එයට පාදක වනුයේ අප ඉදිරිපත් කරන අත්දැකීම් - සිතුම් පැතුම් සහ ඒවාට පසුබිම් වන සාමාජික වාතාවරණයයි. එය පාඨකයාට හුරු පුරුදු ශ්‍රී ලාංකික වාතාවරණයම වෙතොත් එහි වෙනසක් නොදැනෙනු ඇත. එය අප ඉදිරියේ ඇති අනගි අවසරයකින් ප්‍රයෝජන නොගෙන සිටීමක් ද වනු ඇත.

මේ ටික සඳහන් කළේ මේ රට සංස්කෘතියේ හිතකර ලක්ෂණයක් සිය නිර්මාණයකට පසුබිම හැටියට යොදා ගත් කෙටි කතාවක් ගැන කියන්නටය. ''කෙළෙහි ගුණ'' නමින් එන එම කෙටි කතාවෙන් කියැවෙනුයේ ළමා වියේ පටන් ගත් පෙම් බැඳුමකින් අනතුරුව විවාහ වූ පෙම්වතාගෙන් වෙන්ව දුරු රටක වසන කාන්තාවකගේ අතීතාවර්ජනයයි.

කතාව පටන් ගන්නේ උයන් වැනුමකින් යයි කිව හැකිය. උයනක් කෙසේ වුවත්, නිස්කලංක පරිසරයක් ගැන කරනා විස්තරකින්. මේ සොඳුරු පරිසරය පෙම්වතුන්ගේ රජ දහනක් බැව් තැනින් තැන නැගෙන සියුම් කසු කුසුවත්, ප්‍රීතිමත් සිනහ හඬත් මොනවට කියා පාන බව එහිලා කියැවෙයි. කතා නායිකාවගේ සිත යොමු වන්නේ සාමාන්‍යයෙන් පෙම් යුවලකැයි කිව හැකි දෙදෙනෙකු වෙත නොවේ. මහලු යුවලක් වෙතය. ඒ ටික උපුටා දක්වමි.

''මා අසලින් ගමන් ගන්නා මහලු යුවලක් වෙත මගේ නෙත් නිතැතින් ගැටිණි. එකිනෙකාට ළං වී තරයේ දෙඅත් අල්ලා ගත් ඔවුහු සෙමෙන් සෙමෙන් පා නගමින් ගසක් මුල ඉඳි කර ඇති අසුනක වාඩි ගත්හ. මෙතැන ඔවුන් නිතර පැමිණ ඇති පුරුදු තැනකැයි මට සිතාගත හැක. මෙතරම් මහලු වුවද වසර ගණනාවක් එකට ජීවත් වී ඇති ඔවුන්ගේ මුලදී බැඳි ප්‍රේමය තවමත් නොකැළැල්ව ඇති බවක් ඔවුන් එකිනෙකා දෙස බැලූ සැටියෙන් පැහැදිලිවම පෙනුණි. ඔවුන් වෙත දිව ගොස් මෙතෙක් කල් මෙතරම් ළබැදියාවකින් ජීවත් වීමෙහි රහස සොයා බැලීමට ඇත් නම් යයි මට සිතේ.''

ඇයට තමාගේ අතීතය වෙත යොමු වන්නට උචිත නිමිත්තකි. ඒ බව ලේඛකයා කියන්නේ මෙසේය.

''මා නොදැනුවත්ව ම මගේ මනස දුක්බර අතීතය කරා යොමු වන්නට විය.''

ලේඛකයා නොවෙයි, ලේඛිකාව යනුවෙන් නිදොස් විය යුතුයි. මා උපුටා දැක්වූයේ ප්‍රමිතා රෝහිණී නම් ලේඛිකාව විසින් ''හිරුට මුවාවෙන්'' නමින් ලියා ඇති පොතෙහි එන කෙටි කතාවකින්ය.

කාන්තාවගේ පෙම් බැඳුම පිළිබඳ සුල මුල විස්තර වශයෙන් දැක්වුණ ද, විවාහ වූ පසු ස්වාමි පුරුෂයා වෙතින් ආදරය වෙනුවට අවිශ්වාසය හා සැකය එල්ල වීම පිළිබඳ විග්‍රහයක් නොහොත් විස්තරයක් නොතිබීම කෙටි කතාවේ දුබලතාවක් බව කිව යුතුය. ඒ වෙනස හිටි හැටියේ සිදුවන්නක් ලෙසින් පෙනී යන නිසාය.

කතාව අවසන් වන්නේ මෙසේය.

''තණ ඇට ඇඟිඳ කමින් බිම ඉතිරිව සිටි සියොතුන් ටික දෙනා ද කැදලි කරා ඇදෙන්නේ මගේ තනිකම ඔවුන්ටද උසුලා ගත නොහැකි සේය. මම දෙනෙත් යොමා විසිරි යන සෙනඟ දෙස බැලුවෙමි. තවමත් එකිනෙකා අතිනත් ගත් මහලු යුවල සෙමෙන් සෙමෙන් තම නිවස කරා පිය නගනු පෙනේ. මඳක් දුර ගමන් ගත් ඔවුන් පටු මගකින් හැරී නොපෙනී යනතුරු මම සන්තෝෂයෙන් මිශ්‍ර වේදනාවෙන් බලා සිටියෙමි.''

ඇගේ කෙටි කතාවලින් පෙනී යන තවත් ලක්ෂණයක් මෙම උදාත පාඨයෙන් ඉස්මතු වන්නේය. ඒ සිය අත්දැකීම් වටාපිටාවට - සොබා දහමට - එක් කොට ඉදිරිපත් කිරීමෙහිලා ඇය දක්වන හැකියාවය.

පොතට පෙරවදනක් ලියන ගුණදාස අමරසේකර ඇගේ එම හැකියාව, සිය පරිසරය ඇසුරින් ලබන අත්දැකීම් හා අනුදැනීම ''ප්‍රසන්න ලෙස මිශ්‍රණය කිරීමට සමත්වීමෙන්'' පෙනී යන බව කියයි. ''හැර යාම'' නමින් එන කෙටි කතාවෙන් විශේෂයෙන් ප්‍රකාශ වන මෙම හැකියාව අනෙක් බොහෝ කතාවලදී උපයෝගී කර ගෙන ඇති සැටියක් පෙනෙයි.

මහා සංයමයකින් ලියන ඇගේ කෙටි කතා දහසක් සහ කවි බොහෝ ගණනක් ද පොතට ඇතුළත් ය. කෙටි කතා සපුරා වර්ධනය නොකැරුණු බව පෙනෙයි. එසේ කිරීමේ හැකියාව කතුවරියට ඇති බවද පෙනෙයි.

මෙහිලා මට අවධාරණය කිරීමට වුවමනා වූයේ එක් අංශයක් පමණි. ඇගේ කවි ගැන කිසිවක් කීමට මේ තැන නොවෙයි.

GATEWAY
LAWYERS

- Advice on Legal Matters
- Business & Commercial
- Conveyancing - Sale or Purchase of Houses, Vacant Land, Units, Flats, Shops, Factories & Farms
- General, Medical or Enduring Powers of Attorney
- Wills & Estate Planning

Professional, Quality Service Assured

Senanie Kurukularatne LL.B, Grad Dip.LP
Barrister & Solicitor
Attorney -at- Law - Sri Lanka

Phone : 03 87869682
Fax : 03 87869681
Mobile : 0414 660 513
Email : gateway5@bigpond.net.au
17, Glenview Rise, Berwick, VIC 3806 Austraila

Stockdale&Leggo

Buying or selling your home?

Whether you are a first home buyer, experienced investor or upsizing your home, my mission is to provide a personal and professional service to you, For all your real estate needs please call me for free and friendly advice.

"I care about making a difference. My clients are trusting me to help them with one of the biggest decisions they'll make in their lifetime and that is something I take very seriously!"

Sugath Warnasuriya
0422 577 353

Stockdale & Leggo,
Shop 36, The Stables Shopping Centre,
Childs Road Mill Park